6 ශ්‍රේණිය විද්‍යාව

ආලෝකය හා පෙනීම

මාවනැල්ල අධ්‍යාපන කලාපය
විද්‍යා අංශය

පෙනීම සඳහා සම්පූර්ණ විය යුතු අවශ්‍යතා

- ආලෝකය
- ඇස

ආලෝක ප්‍රභව

- ආලෝකය නිකුත් කරන වස්තු ආලෝක ප්‍රභව ලෙස හැඳින්වේ

ස්වාභාවික වස්තු

සූර්යයා   චන්ද්‍රයා   තාරකා

කෘත්‍රිම ප්‍රභව

විදුලි බුබුළු   ලාම්පු   ඉටිපන්දම්

දීප්ත සහ අදීප්ත වස්තු

තමා විසින්ම ආලෝකය නිකුත් කරන වස්තු දීප්ත වස්තු නම් වේ.

අදීප්ත වස්තු

ආලෝකය නිකුත් නොකරන වස්තු අදීප්ත වස්තු නම් වේ.

පහත වගුව සම්පූර්ණ කරන්න

වස්තුව	දීප්ත වස්තුවක් / අදීප්ත වස්තුවක්
සූර්යයා	
විදුලි බුබුළු,	
චන්ද්‍රයා	
චන්ද්‍රයා	
ඉටිපන්දම්	
කණාමැදිරියා,	
පුටුව	

- රාත්‍රි අහසේ ආලෝකවත් වූ චන්ද්‍රයා අපට දැකගත හැකි ය. මේ නිසා චන්ද්‍රයා දීප්ත වස්තුවක් ලෙස සමහර විට ඔබට සිතෙන්නට ඇත. නමුත් චන්ද්‍රයා විසින් නිකුත් කරන්නේ තමාගේ ම ආලෝකය නොවේ. චන්ද්‍රයාගේ පෘෂ්ඨය මත පතිත වන හිරු එළිය නිසා චන්ද්‍රයා ආලෝකවත් වස්තුවක් ලෙස අපට දිස් වේ. එම නිසා ආලෝකවත් ව දිස් වුව ද චන්ද්‍රයා දීප්ත වස්තුවක් නොවේ.

ද්‍රව්‍ය තුළින් ආලෝකය ගමන් කිරීම



පාරදෘශ්‍ය ද්‍රව්‍ය

- සමහර ද්‍රව්‍ය තුළින් බැලූවිට අනෙක් පස ඇති ආලෝකය මෙන් ම වස්තු ද පැහැදිලි ව දැකිය හැකි ය. එසේ වන්නේ එවැනි ද්‍රව්‍ය තුළින් ආලෝකය ක්‍රමවත්ව ගමන් කිරීම නිසා ය. එවැනි ද්‍රව්‍ය **පාරදෘශ්‍ය ද්‍රව්‍ය** ලෙස හැඳින්වේ
- උදාහරණ

  වීදුරු

  විනිවිද පෙනෙන අවර්ණ පොලිතීන්

පාරභාසක ද්‍රව්‍ය

- සමහර ද්‍රව්‍ය තුළින් බැලූ විට අනෙක් පස ඇති ආලෝකය පෙනෙන නමුත් වස්තුව පැහැදිලි ව නොපෙනේ. එසේ වන්නේ එම ද්‍රව්‍ය තුළින් ආලෝකය අක්‍රමවත් ව ගමන් කිරීම නිසා ය.

එවැනි ද්‍රව්‍ය **පාරභාසක ද්‍රව්‍ය** ලෙස හැඳින්වේ

තෙල් කඩදාසි,

බොර ජලය,

පාට විදුරු කඩදාසි

පාරාන්ධ ද්‍රව්‍ය

- බොහෝ ද්‍රව්‍ය තුළින් බැලූ විට අනෙක් පස ඇති ආලෝකය හෝ වස්තු හෝ දක්නට නොලැබේ. එසේ වන්නේ එවැනි ද්‍රව්‍ය තුළින් ආලෝකය ගමන් නොකිරීම නිසා ය. ඒවා **පාරාන්ධ ද්‍රව්‍ය** ලෙස හැඳින්වේ
- උදාහරණ

  කාඩ්බෝඩ්

  ලී

  ලෝහ

  කඩදාසි

  තාර

පාරදෘශ්‍ය ද්‍රව්‍ය

ආලෝකය ක්‍රමවත්ව ගමන් කරන ද්‍රව්‍ය පාරදෘශ්‍ය ද්‍රව්‍ය නම් වේ.

පාරභාසක ද්‍රව්‍ය

ආලෝකය අක්‍රමවත්ව ගමන් කරන ද්‍රව්‍ය පාරභාසක ද්‍රව්‍ය නම් වේ.

පාරාන්ධ ද්‍රව්‍ය

ආලෝකය ගමන් නොකරන ද්‍රව්‍ය පාරාන්ධ ද්‍රව්‍ය නම් වේ.

- ඇගයීම

පහත දැක්වෙන ද්‍රව්‍ය පාරදෘශ්‍ය, පාරභාසක, පාරාන්ධ ලෙස වර්ග කරන්න.

වීදුරු, ලෝහ තහඩු, ලී, අවර්ණ පොලිතින්, තෙල් කඩදාසි, බොර ජලය, පාට විෂුවු කඩදාසි, කඩදාසි,තාර, ජලය, පැණිබීම, භූමිතෙල්, පැණි, දැවුණු එන්ජින් ඔයිල්

පාරදෘශ්‍ය	පාරභාසක	පාරාන්ධ

ආලෝකයේ ගමන් මග



ආලෝක කිරණ හා ආලෝක කදම්බ

- ආලෝක කිරණය

ආලෝකය ගමන් කරන ඉතා පටු ගමන් මාර්ගයක් ආලෝක කිරණයක් නම් වේ.

- ආලෝක කදම්බය

ආලෝක කිරණ රාශියක් එකතු වීමෙන් ආලෝක කදම්බයක් සෑදේ.

- ක්‍රියාකාරකම 5.6 සිදු කර නිරීක්ෂණ ලියන්න

ආලෝකයේ ප්‍රයෝජන

Deep Creek Images


Light
Carbon Dioxide
+
Water
Carbohydrates
Oxygen


Ocular Lens (Eyepiece)
Body Tube
Revolving Nosepiece
Objectives
Arm
Stage
Stage Clips
Coarse Adjustment Knob
Diaphragm
Fine Adjustment Knob
Light Source
Base

icpress.cn 版权作品 请勿转载



ආලෝකයේ ප්‍රයෝජන



ආලෝකයේ ප්‍රයෝජන


ආලෝක
යේ
ප්‍රයෝජන
ශාක වල
අහාර
නිෂ්පාදනය
විනෝදාස්
වාදය
වෛද්‍ය
ක්ෂේත්‍රය
සන්නිවෙ
දනය
සංඥා
නිකුත්
කිරීම
ප්‍රදීපනයට
පෙනීම
ලබාදීම

ඇගයීම

හිස් තැනට සුදුසු වචනය තෝරන්න.

1. ආලෝකය ....විශේෂයකි.

- පාරාන්ධ
- පාරදෘශ්‍ය
- ශක්ති
- සංඥා

හිස් තැනට සුදුසු වචනය තෝරන්න.

2. ආලෝකය ....මාර්ගයක ගමන් කරයි.

ඊ හිසක්

පාරදෘශ්‍ය

සරල රේඛීය

සංඥා

හිස් තැනට සුදුසු වචනය තෝරන්න.

3. ආලෝකය ගමන් නොකරන ද්‍රව්‍ය.........................ද්‍රව්‍ය ලෙස හැඳින්වෙයි.

ශක්ති

පාරාන්ධ

පාරදෘශ්‍ය

සංඥා

හිස් තැනට සුදුසු වචනය තෝරන්න.

4. ආලෝක කිරණයක ගමන් දිශාව දැක්වීමට.................................. භාවිත කෙරෙයි.

ඊ හිසක්

හිරුඑලිය

සරල රේඛීය

සංඥා

හිස් තැනට සුදුසු වචනය තෝරන්න.

5. මාර්ග සංඥා වලදී ....යොදා ගන්නේ වැඩි අවධානයක් ලබා ගැනීම සඳහාය.

ර් හිසක්

හිරුඑළිය

පාරාන්ධ

ආලෝක සංඥා

- පහත සඳහන් වාක්‍ය තනි වචනයකින් හෝ වචන දෙකකින් හඳුන්වන්න

i. තමා විසින් ම ආලෝකය නිකුත් කරන වස්තු ....

ii. තමා විසින් ම ආලෝකය නිකුත් නොකරන වස්තු ....

iii. ආලෝකය ගමන් කිරීමට ඉඩ දෙන අතර පැහැදිලි ව අනෙක් පැත්තේ ඇති වස්තුව ද දැකීමට හැකි ද්‍රව්‍ය ....

iv. ආලෝකය ගමන් කිරීමට ඉඩ දෙන නමුත් අනෙක් පැත්තේ ඇති වස්තුව පැහැදිලි ව දැකිය නොහැකි ද්‍රව්‍ය ....

v. ආලෝක කිරණ රාශියක එකතුව ....